(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 14.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 නොවැම්බර් මස 04 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

42/’15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ හඳුන්කූරු හා සුවඳ දුම් කුඩු පරිභෝජනය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(ii) මෙම ප්‍රමාණයෙන් ශ්‍රී ලංකාවේ නිපදවන හා පිටරටින් ගෙන්වන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හඳුන්කූරු හා සුවඳ දුම් කුඩු සෑදීමට ගන්නා අමුද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම අමුද්‍රව්‍ය මිනිස් සිරුරට අහිතකර ද නැද්ද යන්න පිළිබඳ පරීක්ෂා කරන ආයතනයක් රට තුළ තිබේද;

(iii) එසේ නම්, එම ආයතනයේ නම කවරේද; සහ

(iv) එම ආයතනය මගින් පරීක්ෂා කිරීමේදී මිනිස් සිරුරට හානිකර අමුද්‍රව්‍ය භාවිතා කරමින් හඳුන්කූරු හා සුවඳ දුම් කුඩු නිෂ්පාදනය කළ ආයතන හඳුනාගෙන තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) හඳුන්කූරු හා සුවඳ දුම් නිෂ්පාදනය කිරීමේදී මිනිස් සිරුරට අහිතකර රසායන ද්‍රව්‍ය භාවිතය වැළැක්වීමට පියවර ගන්නේද; සහ

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

91/’15

2.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය අතුරු අයවැයෙන් සිමෙන්ති විකුණුම් මිල තුළ ඇතුළත්ව තිබූ රු. 90.00ක බද්දක් ඉවත් කරනු ලැබුවේ සිමෙන්ති මිල අඩු කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් නොවේද; සහ

(ii) ඒ නිසා රජයට මසකට අහිමි වූ බදු ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම මිල අඩුකිරීම 2015 පෙබරවාරි මස 20 වන දින ගැසට් පත්‍රයේ පළකරනු ලදුව සිල්ලර මිල රු. 840.00ක් ලෙස නියම කර තිබේද;

(ii) එදින සිට අද දක්වා එම මිලට දිවයින පුරා සිමෙන්ති අලෙවි වන්නේද; සහ

(iii) නොඑසේ නම්, රජයේ ආදායමද, අහිමි වී පාරිභෝගිකයාට ලබාදීමට අරමුණු කළ සහනයද නොලැබී යාම බරපතල වරදක් නොවන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අතුරු අයවැයෙන් ප්‍රකාශ කළ පරිදි මෙම මිල අඩුවීම ක්‍රියාත්මක කරවීම සඳහා පියවර ගන්නේද; සහ

(ii) එසේ නම්, එම පියවර බලපවත්වනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

148/'15

3\.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට දරුවන් දෙදහසකට ආසන්න සංඛ්‍යාවක් විද්‍යා, තාක්ෂණ, වාණිජ හා කලා යන විෂය ධාරාවන් හතර යටතේ අධ්‍යාපනය ලබන මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලය බරපතල ගොඩනැගිලි අර්බුදයකට මුහුණ පා සිටින බවත්;

(ii) නේවාසිකාගාරය, ශ්‍රවණාගාරය සහ තෙමහල් නව ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ කළද, පසුගිය ජනවාරි මස 15 දින සිට එම සියලු ඉදිකිරීම් අතරමග නවතා දමා ඇති බවත්; සහ

(iii) ක්‍රීඩාපිටිය සඳහා බිම් කොටස් පවරාගනු ලැබුවද, එහි ඉදිකිරීම් ප්‍රමාද වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම විද්‍යාලයේ නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේනම්, එම දිනය කවරේද;

(iii) නවතා දමා ඇති අනෙකුත් ඉදිකිරීම් ආරම්භ කරන දිනය කවරේද;

(iv) දහස් ගණනක් වූ දරුවන්ට අත්‍යවශ්‍ය ක්‍රීඩා පහසුකම් සඳහා පිටිය සකස් කරන්නේද; සහ

(v) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලය වසා දැමීමේ උත්සාහයක් ඇතැයි ප්‍රචාරය වන මතයේ සත්‍ය අසත්‍ය බව එතුමා මෙම සභාවට හෙළිකරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

43/'15

4\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මස් සඳහා ඇතිකරන බ්‍රොයිලර් කුකුළන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ගැටලු පවතින බවත්;

(ii) ගොවිපොළ හිමියන් නියමිත දින ගණනට පෙර මෙම සතුන් මස් සඳහා ඝාතනය කරන බවත්; සහ

(iii) එම සතුන් ඉක්මනින් වැඩීම සඳහා යොදා ගන්නා බෙහෙත් ද්‍රව්‍ය සහ ආහාර මිනිස් සිරුරට හානිකර බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මස් සඳහා බ්‍රොයිලර් කුකුළන් ඇති කරන ගොවිපොළ සංඛ්‍යාව;

(ii) මෙම ගොවිපොළවල සිටින කුකුළන් සංඛ්‍යාව;

(iii) 2014 වර්ෂයේ කුකුළු මස් නිෂ්පාදනය (කිලෝග්‍රෑම්); සහ

(iv) ඒ අනුව ඒක පුද්ගල කුකුළු මස් පරිභෝජනය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) හි සඳහන් ගැටලු විසඳීමට පියවර ගෙන තිබේද; සහ

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

92/'15

5\.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හමුදා සාමාජිකයින්ගේ දරුවන් සඳහා වෙන්වූ පාසල් වෙනම පවත්වාගෙනයාමේ ප්‍රතිපත්තිය එතුමා පිළිගන්නෙහිද?

(ආ) හමුදාවේ පරිත්‍යාගශීලී වූ, නිලධාරීන් හා යුධ භටයන් දෙපිරිසම වෙනුවෙන් විශේෂ වරප්‍රසාද ලබාදීම අවශ්‍ය වුවත්, ඔවුන්ගේ දරුවන්ට වෙනම පාසල් තිබීමෙන් සමාජයේ නව සමාජ ප්‍රභේදයක් මත පහසුකම් ඇති කරනු ලබන බවත් එතුමා තවදුරටත් පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම පාසල්වල සිටින නිලධාරීන්ගේ දරුවන් හා සාමාන්‍ය සෙබළුන්ගේ දරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(ii) මෙවැනි පාසල්, අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතට ගෙන අනෙකුත් දරුවන්ද ඇතුළත් කරගෙන පවත්වාගෙන යාමට අදහස් නොකරන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

44/'15

6\.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලක්ෂපාන දිය ඇල්ලට ඉහළින් මස්කෙළිය ඔයේ ඉදිකර ඇති හා ඉදිකරමින් පවතින විදුලි බලාගාර වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම විදුලි බලාගාර හේතුකොට ගෙන පරිසරයට සිදු වන බලපෑම් පිළිබඳව පරිසර අධ්‍යයන වාර්තා කැඳවා තිබේද; සහ

(iii) එසේ නම්, එම වාර්තා මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලක්ෂපාන දිය ඇල්ලට උක්ත බලාගාරයන් හේතුවෙන් හානි විය හැකි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම හානි අවම කර ගැනීමට පියවර ගෙන තිබේද; සහ

(iii) එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— 2015.10.06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන් වුවද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 2.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 125 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් විසි හතර දෙනෙකුගෙන් (24) සමන්විත විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 126 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් විසි හතර දෙනෙකුගෙන් (24) සමන්විත විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 128 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් විසි දෙනෙකුගෙන් (20) සමන්විත විය යුතු ය.

5.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 1),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ, ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.09.23 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 ජනවාරි 29 දිනැති අංක 1899/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 2),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.09.23 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 3),— (235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ 10 වැනි වගන්තිය යටතේ, ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.10.06 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 මැයි 5 දිනැති අංක 1913/3 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— (52 වැනි අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමග කියවනු ලබන 25 වැනි වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූනි 11 දිනැති අංක 1918/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2015.09.23 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සිංගප්පූරු ජනරජයේ ආණ්ඩුව අතර, 2014 අප්‍රේල් මස 03 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 28 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 16 (ඇ) වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 973 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**